සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 09 - 2023

## බුද්ධ ධර්මය

**කාලය පැය 02**

නම / විභාග අංකය:

- **පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 02 බැගින් හිමි වේ.**
- **දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

### I කොටස

- **අංක 01-05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. බුදුරජාණන් වහන්සේට අවසන් දානය පූජා කරනු ලැබුවේ,
    (i) සුජාතා සිටු දේවියට (ii) ධම්මාරාමට
    (iii) චුන්ද කර්මාර පුත්‍රයාට (iv) විශාඛා සිටු දේවියට

02. හුස්ම ගැනීම හා පිට කිරීම පිළිබඳ සිහිය පිහිටුවා කරන භාවනාව වන්නේ,
    (i) බුද්ධානුස්සති භාවනාව (ii) මෛත්‍රී භාවනාව
    (iii) විපස්සනා භාවනාව (iv) ආනාපානසති භාවනාව

03. බිම්බා දේවිය නමින් ප්‍රකට වූයේ,
    (i) යසෝදරා දේවිය (ii) ප්‍රජාපති ගෝතමී දේවිය
    (iii) මහාමායා දේවිය (iv) කිසා ගෝතමී දේවිය

04. සීල, සමාධි, ප්‍රඥා යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
    (i) ත්‍රිවිද්‍යාව (ii) ත්‍රි ලක්ෂණය
    (iii) ත්‍රිවිද ශික්ෂාව (iv) තිසරණය

05. පුද්ගලයෙකු ණය නොවී සිටීමෙන් විඳින්නා වූ සැපය බුදු දහමෙහි හඳුන්වන්නේ,
    (i) අත්ථි සුඛ යනුවෙනි (ii) අනණ සුඛ යනුවෙනි
    (iii) භෝග සුඛ යනුවෙනි (iv) අනවජ්ජ සුඛ යනුවෙනි

- **අංක 06-10 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස් තැන් මත ලියන්න.**

(අත්තූපනායික ධර්ම පර්යාය / සමජීවිකතාව / උපතිස්ස / අවිහිංසා සංකප්ප /සිඟාලක)

06. සැරියුත් හිමි ගිහිකල හැඳින්වූයේ .......................................................... නමිනි.
07. හිංසාවෙන් වෙන්වීමේ සංකල්පනාව .......................................................... ලෙස හඳුන්වනු ලබයි.
08. බුදුරජාණන් වහන්සේ උපයන ධනය විනාශයට හේතු වන කරුණු හයක් පිළිබඳ දේශනා කළේ .................................. නම් ගෘහපතිට ය.
09. තමා උපමා කොට අනුන්ට හිංසා පීඩා නොකිරීම .......................................................... නම් වේ.
10. අයවැය සමව පවත්වා ගැනීම බුදු දහමේ දී .......................................................... ලෙස හඳුන්වයි.

- **ප්‍රශ්න අංක 11-15 දක්වා ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණද වැරදි නම් (✕) ලකුණද ඉදිරියේ දී ඇති වරහන් තුළ යොදන්න.**

11. ජීවත්වීමේ අයිතිය සෑම සත්වයෙකුටම පොදු බව බුදු දහමින් පිළි නොගනියි. ( )
12. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ රචනා වූයේ දඹදෙණි යුගයේදීය. ( )
13. කුසගින්න ලොව බලවත්ම රෝගය වේ. ( )
14. තිදොරින් අකුසල කර්මවල යෙදීම අනවජ්ජ සැපය වේ. ( )
15. මහිච්ඡතාව යනු අසීමිත ආශාවන් ඇති බවයි. ( )

- **ප්‍රශ්න අංක 16-20 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යා කරන්න.**

| | | |
|---|---|---|
| 16. සම්මා කම්මන්ත | දස අකැප වස්තුව | |
| 17. හේතු ඵල දහම | සිගාලෝවාද සූත්‍රය | |
| 18. මිච්ඡා ආජීව | සොරකමෙන් වැළකීම | |
| 19. අනුමති කප්පෝ | අස්සජි හිමි | |
| 20. සේව්‍ය සේවක යුතුකම් | වසවිෂ වෙළදාම | (ලකුණු 2×20=40) |

# බුද්ධ ධර්මය - 9 ශ්‍රේණිය

## II කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය සඳහා ලකුණු 20 ක් ද තෝරා ගත් අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද හිමි වේ.**

**01. කෙටි පිළිතුරු ලියන්න.**

(i) අතීතයේ තිබූ දුෂ්කරම වන්දනා ගමන් දෙක වූයේ මොනවාද?

(ii) අකුසල මූල අතරින් 02 ක් ලියන්න.

(iii) ගිහියාගේ නිත්‍ය ශීලය කුමක්ද?

(iv) ස්ථූප ආකෘති අනුව ස්ථූප වර්ග 02ක් ලියා දක්වන්න.

(v) බෞද්ධයකු විසින් දැක සංවේගය උපදවා ගත යුතු ස්ථාන අතරින් 02ක් ලියන්න.

(vi) තෙරුවන් නම් කරන්න.

(vii) ධාර්මික ධනෝපායන මාර්ග 02 ක් ලියන්න.

(viii) අනුරාධපුර යුගයට අයත් චිත්‍ර හමුවන ස්ථාන 02 ක් සඳහන් කරන්න.

(ix) භාවනා කිරීම සඳහා වාඩිවීමට යොදා ගන්නා ඉරියව් 02 ක ලියන්න.

(x) ''ආරෝග්‍ය පරමාලාභා'' යන්නෙහි අර්ථය දක්වන්න. (ල. 2×10=20)

**02.** (i) සදිසාවේ එන උඩ දිශාවට හා යට දිශාවට අයත් සමාජ කණ්ඩායම් නම් කරන්න. (ල. 2)

(ii) පැවිදි උතුමන් විසින් ගිහියා කෙරෙහි ඉටු කරන යුතුකම් 03 ක් ලියන්න. (ල. 3)

(iii) ගිහියා විසින් ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් යුතුකම් ඉටු කළ යුතු ආකාරය දක්වන්න. (ල. 5)

**03.** (i) පටිච්ච සමුප්පාද ධර්මය හඳුන්වන වෙනත් නමක් ලියන්න. (ල. 2)

(ii) පටිච්ච සමුප්පාද සූත්‍රය ලියන්න. (ල. 3)

(iii) මෙම න්‍යාය පාසල් සිසුන්ට මතුවන ගැටලු විසදා ගැනීමට යොදා ගත හැකි ආකාරය දක්වන්න. (ල. 5)

**04.** (i) තුන්වන ධර්ම සංගායනාව පැවැත්වීමට හේතුව කුමක්ද? (ල. 2)

(ii) එම සංගායනාවට අනුග්‍රහය දුන් රජු, පැවැත්වීමට ගත වූ කාලය, හඳුන්වන නම ලියන්න. (ල. 3)

(iii) තෙවන ධර්ම සංගායනාවෙන් ලැබූ ප්‍රතිඵල පෙන්වා දෙන්න. (ල. 5)

**05.** (i) දස රාජ ධර්ම අතුරින් 02 ක් නම් කරන්න. (ල. 2)

(ii) ඉන් එක් කරුණක් පිළිබඳ කෙටියෙන් ලියන්න. (ල. 3)

(iii) දස රාජ ධර්ම සුරකින පාලකයා තුළ දක්නට ඇති ලක්ෂණ 05 ක් ලියන්න. (ල. 5)

**06.** (i) ශ්‍රද්ධාවේ මූලික ප්‍රභේද 02 ක නම් කරන්න. (ල. 2)

(ii) ඒ අතුරින් බෞද්ධයකු විසින් ඇති කර ගත යුතු ශ්‍රද්ධාව පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල. 3)

(iii) පෙළ අටුවායෙන් දක්වන ශ්‍රද්ධාවේ ප්‍රභේද අතුරින් 05ක් ලියා දක්වන්න. (ල. 5)

**07. පහත දී ඇති මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.**

(i) බලංගොඩ ආනන්ද මෛත්‍රීය හිමි (ii) භද්ද කච්චානා තෙරණිය

(iii) නිර්වාණය (iv) දස කුසල් (ල. 2×5=10)